## මෙහෙයුම් හා නඩත්තු ආයතනවල තොරතුරු

**අපජලය රැස්කිරීමේ නළ ජාලය සහ කුඩා පොම්පාගාර පිළිබඳ මෙහෙයුම් සහ නඩත්තුව**

නාගරික කොමසාරිස්
මහ නගර සභාව
මහනුවර

- 081 2223921
- 081 2223921
- kmcdrainage@gmail.com

නාගරික ඉංජිනේරු (ජලාපවහන)
මහ නගර සභාව
මහනුවර

- 081 2222275
- 081 2223806
- kmcdrainage@gmail.com

**ප්‍රධාන පොම්පාගාරය, අපජල පිරිපහදුව සහ රොන්බොර වියළුම් තටාක පිළිබඳ මෙහෙයුම් සහ නඩත්තුව**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මධ්‍යම),
ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
ගැටඹේ, පේරාදෙණිය

- 081 2387175
- 081 2388027
- dgmcentral2018@gmail.com

කළමණාකරු, (අපජල පිරිපහදුව)
මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
ගැටඹේ, පේරාදෙණිය

- 081 2385903 / 081 2384717
- 081 2386393
- kcwmp@yahoo.com

තොරතුරු පියස,

- 081 4650900 / 081 4954016
- kcwmp.prc@gmail.com

## ව්‍යාපෘතියෙන් ලැබෙන වක්‍ර ප්‍රතිලාභ

- නගරය පිරිසිදු වන විට ඒ නගරය තුළ ජීවත් වන නගර වැසියන් තුළ අභිමානයක් ඇතිවීම.
- නගරය රමණීය වූ විට දෙස් විදෙස් සංචාරකයන්ගේ පැමිණීම ඉහළ යන අතර, එමගින් නගර වාසීන්ගේ හා ව්‍යාපාරිකයින්ගේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීමට බලපෑමක් ඇති වීම.
- නාගරික වැසියන් සෞඛ්‍ය සම්පන්න වූ විට ඔවුනට ලෙඩ රෝග සඳහා වැය කරන්නට සිදු වන මුදල අවම වීම.
- නාගරික ජනයා තුළ තමන්ගේ, තම පවුලේ සහ තමන් ජීවත් වන වටා පිටාවේ සනීපාරක්ෂාව සම්බන්ධයෙන් වඩාත් යහපත් ආකල්ප වර්ධනය වීම.
- පූතික ටැංකි සහ අවශෝෂණ ටැංකි නොමැති වීම නිසා, එමගින් පොළවට උරා ගන්නා ජලය අඩු වන හෙයින් සිදු විය හැකි නාය යාමේ අවදානම අඩු වීම.
- ජීවයන්ගේ පැවැත්ම සඳහා උපකාරී වන ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීමට සහය වීම.

## ව්‍යාපෘතියේ අනාගත පැවැත්ම තහවුරු කිරීමේ ප්‍රවේශය

- ව්‍යාපෘතිය සම්බන්ධ තොරතුරු ලබා දීම සඳහාත් සේවාලාභීන්ගේ මෙහෙයුම් හා නඩත්තු ගැටළු පිළිබඳව පැමිණිලි කිරීම හා ඒ සඳහා ක්ෂණිකව මැදිහත් වීම සඳහා වෙනම මැදිරියක් (තොරතුරු පියස) පිහිටුවා තිබීම.
- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කාල සීමාවේදී අපජලය සේවා සම්බන්ධතා ලබා දීම සඳහා මුදල් අය නොකරන අතර ව්‍යාපෘතිය නිම වීමෙන් පසු අපජල සම්බන්ධතා නගර සභාව වෙත මුදල් ගෙවා ලබා ගත යුතුය.
- අපජල කළමනාකරණ ව්‍යාපෘතියට සම්බන්ධ වීම අනිවාර්යය කිරීම සඳහා මහනුවර මහ නගර සභාව විසින් ඒ සඳහා වූ නීති රීති සම්මත කොට ඇති අතර, ඒවා ක්‍රියාත්මක කරනු ලැබේ.
- මහනුවර නගර සභාව මේ සඳහාම වෙන් වූ අපජල කළමනාකරණ ඒකකයක් පිහිටුවා ඇති අතර අවශ්‍ය තාක්ෂණික හා පරිපාලන දැනුමක් සහිත නිළධාරීන් ඒ සඳහා පත් කර ඇත.
- මහනුවර මහ නගර සභාව සහ ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය ඒකාබද්ධව ඇති කර ගත් නෛතික ඒකඟතාවයක් මත ව්‍යාපෘතියේ ඉදිරි පැවැත්ම තහවුරු කරනු වස් එහි නඩත්තු හා මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබයි.

## මහනුවර නාගරික වැසියන්ගේ, ව්‍යාපාරිකයන්ගේ හා බාහිරින් පැමිණෙන්නන්ගේ වගකීම්

- අපජලය හැර වෙනත් අයුරකින් ජනනය වන්නා වූ ජලය (වහලින් වැටෙන හෝ ගලා යන වැසි ජලය වැනි) නව අපජල ප්‍රවාහන නළ මාර්ගයට යොමු නොකිරීම.
- වෛද්‍ය රසායනාගාර, වාහන සේවා ස්ථාන, කර්මාන්ත ශාලා, රූපලාවන්‍යාගාර මගින් හා කෘෂි රසායන සේවා මධ්‍යස්ථාන මගින් ඉවතලන අපජලය එම ආයතන විසින් මූලික පිරිපහදුවකට ලක් කර ගෘහස්ථ අපජලයේ ඇති සංයුතීන්ට සමාන මට්ටමට පත් කර අපජල පද්ධතියට යොමු කිරීම.
- ඔබගේ නිවාස පරිශ්‍රය තුළ ඉදිකරන සේවා කුටීරය තුළට මොනම හේතුවක් නිසා හෝ පොලිතීන්, වීදුරු කටු, කාඩ්බෝඩ් කැබලි, ප්ලාස්ටික් වැනි ඝන අපද්‍රව්‍ය වර්ග නොදැමීම.
- ව්‍යාපෘතිය සහ එයින් ලැබෙන ප්‍රයෝජන හා ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු ඔබගේ අසල්වාසීන් සමග හුවමාරු කර ගැනීම.
- අසල්වාසීන්ට සේවා සම්බන්ධතා ලබා දීමේදී අවශ්‍ය වුවහොත් ඔබගේ ඉඩමේ මායිමෙන් සේවා නළ එලීමට කාරුණික සහයෝගය ලබා දීම.
- පරිශ්‍රයක් තුළ ඇති අපජල නළ ජාලය හ අනෙකුත් උපාංග ඉදිකර ඇති ස්ථාන දැක්වෙන නිවැරදි සැළැස්මක් ව්‍යාපෘතිය විසින් සියලුම පරිශ්‍ර හිමියන් වෙත ලබා දෙන අතර, අනාගතයේදී පරිශ්‍රය තුළ සිදු කෙරෙන ඉදිකිරීම් අවස්ථාවන්හිදී මෙම සැළසුම පරිශීලනය කිරීම.
- මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය හා බැඳි මධ්‍යගත පිරිපහදු ඒකකය ගන්නෝරුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ආසන්න අක්කර 07ක පමණ භූමි කොටසක ඉදි කර ඇත. නගරය තුළ ජනනය වන්නා වූ සියලුම අපජලය නළ මගින් අපජල පිරිපහදු පද්ධතිය වෙත ගෙන ගොස් අපජලයේ ඇති අපද්‍රව්‍ය ඉවත් කර පරිසරයට හානිකර නොවන අයුරින් පිරිපහදු කර පිරිසිදු ජලය මහවැලි ගඟට මුදා හරිනු ලැබේ.



# සුවැති පිවිතුරු මහනුවරක්



## මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

මහනුවර මහ නගර සභාව

## පසුබිම

ලෝක උරුමයන් අතරට එක් වූ මෙන්ම ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම නගරය වන මහනුවර දෙස් විදෙස් සංචාරකයින්ගේ ඉමහත් ආකර්ෂණයට ලක්වූ සුන්දර නගරයකි. අද වන විට මහනුවර නගරයේ ස්ථිර පදිංකරුවන් 150,000 පමණ වන අතර විවිධ අවශ්‍යතා සඳහා දිනපතා නගරයට පැමිණෙන්නන්ගේ සංඛ්‍යාව 300,000 ක් පමණ වේ.

පසුගිය දශක කිහිපයක් තිස්සේ සිදුවූ සීඝ්‍ර නාගරීකරණය හා ජනගහන වර්ධනය හේතුවෙන් නගරය දැඩි සෞඛ්‍යමය, සමාජීය සහ පාරිසරික ගැටළු රැසකට මුහුණාදෙමින් තිබේ.

ඒවා අතරින් වඩාත් සංකීර්ණ ගැටළුව වන්නේ නගරය තුළ ජනනය වන්නාවූ අපජලය, නගරයේ ඇති කාණු පද්ධති, ඇලමාර්ග සහ කුඩා ජල පහරවල් ඔස්සේ ගලාවිත් මහනුවර සහ මාතලේ නගර සඳහා පානීය ජලය සැපයෙන ප්‍රධානතම ජල මූලාශ්‍රය වන මහවැලි ගංගාවට සහ මහනුවර නගරය තුළ පිහිටි වඩාත් ආකර්ශණීය නුවර වැවට එක් වී ජලය ඉතා අධික ලෙස දූෂණය වෙමින් පැවතීමයි.



### අපජලය

මිනිසා විසින් විවිධ ක්‍රියාකාරකම් සඳහා ප්‍රයෝජනයට ගෙන ඉවතලන ගුණාත්මක බවින් හීන වූ ජලය අපජලය වශයෙන් සැලකේ. එනම් නිවෙස්, ආපනශාලා, ව්‍යාපාරික ස්ථාන, ආරෝග්‍ය ශාලා සහ වෙනත් සේවා ආයතන වලින් අඩුම වශයෙන් එක් වරක් වත් ප්‍රයෝජනයට ගෙන ඉවතලන ජලයයි, අප විසින් එම අපජලය කොටස් දෙකකට වෙන් කරනු ලබයි.

එනම්

- **අළු දිය** නමින් (Gray Water) හඳුන්වනු ලබන රෙදි සේදූ ජලය, නාන කාමර, මුහුණ සෝදන බේසම් සහ මුළුතැන්ගෙය තුළින් බැහැර කරන අපජලය.
- **කළු දිය** නමින් (Black Water) හඳුන්වනු ලබන වැසිකිළි තුළින් පිටවන මල මිශ්‍ර අපජලය.

## මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය

මහනුවර නගරය ආකර්ශණීය සහ වඩාත් සෞඛ්‍ය සම්පන්න නගරයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ජන රජයේ සහ ජපාන රජයේ ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (Japan International Cooperation Agency - JICA) විසින් සපයනු ලබන මූල්‍යාධාර මත, ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය සහ මහනුවර මහ නගර සභාව ඒකාබද්ධව මහනුවර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසන් වීමෙන් අනතුරුව පවිත්‍රාගාරය සහ ප්‍රධාන පොම්පාගාරයේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් ද, සේවා සම්බන්ධතා සහ කුඩා පොම්පාගාරවල මෙහෙයුම් සහ නඩත්තු කටයුතු මහනුවර මහ නගර සභාව මගින් ද සිදු කරනු ලැබේ.

### අපජල කළමනාකරණ චක්‍රය




මහවැලි ගඟෙන් ලබා ගන්නා ජලය විධිමත්ව පිරිපහදු කොට නිවාස සහ ව්‍යාපාරික ස්ථාන සඳහා බෙදාහැරීමෙන් අනතුරුව එම පරිශ්‍ර වලින් ප්‍රයෝජනයට ගෙන බැහැර කරන අපජලය නැවත නල පද්ධතියක් මගින් පිරිපහදු සංකීර්ණය වෙත යොමු කෙරේ. එමගින් අපජලය පිරිපහදු කොට පරිභරණයට හිතකර අයුරින් පිරිසිදු කල ජලය නැවත මහවැලි ගඟට මුදා හැරේ. මෙම ක්‍රමවේදය තුළින් මහනුවර නගරයේ නිවාස පරිශ්‍රයන් 8,504 ක්, ව්‍යාපාරික පරිශ්‍ර 2,568 ක් ප්‍රයෝජනය ලබනු ඇත.

### ව්‍යාපෘති ආවරණ ප්‍රදේශය සහ ඉලක්ක




අධි ජන ඝණත්වයක් ඇති ප්‍රදේශවල ජනතාවගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීම

- පැවති පොදු වැසිකිළි පද්ධති 14ක් වැඩි දියුණු කිරීම
- පොදු නාන ස්ථාන 01ක් වැඩි දියුණු කිරීම
- පුද්ගලික වැසිකිළි 380ක් ප්‍රතිලාභී ප්‍රජාවගේ සහභාගිත්වයෙන් ඉදිකිරීම

## ව්‍යාපෘතියේ අරමුණු

- මහනුවර නගර වැසියන්ගේ සෞඛ්‍ය සහ සනීපාරක්ෂාව ඉහල නැංවීම.
- මහනුවර නගරය වඩාත් ආකර්ශණීය කරන්නා වූ නුවර වැවේ සහ මහනුවර නගරය හා තදාසන්න ප්‍රදේශ සඳහා ඇති එකම පානීය ජල මූලාශ්‍රය වන මහවැලි ගඟෙහි ජලය දූෂණය වීම වැළැක්වීම.
- මහනුවර නගරය තවදුරටත් ආකර්ෂණීය නගරයක් ලෙසින් දියුණු කිරීම තුළින් දෙස් විදෙස් සංචාරකයින්ගේ ආකර්ෂණය වැඩි කිරීම

## ව්‍යාපෘතියෙන් ලැබෙන සෘජු ප්‍රතිලාභ

- නගරය තුළ පිහිටි නිවාස ඇතුළුව සෑම ගොඩනැගිල්ලකින්ම ජනනය වන්නා වූ අපජලය ඒ ඒ පරිශ්‍ර තුළින් ඉවත් කිරීමට පියවර ගැනීම.
- ගොඩනැගිලි පරිශ්‍රයන් තුළ පූතික ටැංකි සහ අවශෝෂණ ටැංකි තව දුරටත් පවත්වා ගැනීම අවශ්‍ය නොවන හෙයින් ඒවා වෙනුවෙන් දැනට යොදා ගෙන ඇති බිම් කොටස් නිදහස් වන අතර ඒවා වෙනත් කාර්යයන් සඳහා යොදා ගැනීමට හැකිවීම.
- ලෙඩ රෝග බෝ කරන මැස්සන්, මදුරුවන් සහ කැරපොත්තන් වැනි ජීවීන් බෝවන පූතික ටැංකි සහ අවශෝෂණ ටැංකි නිවාස හා ගොඩනැගිලි පරිශ්‍රයන් තුළ නොමැති වීම නිසා එම පරිශ්‍රයන් පිරිසිදු හා සෞඛ්‍ය සම්පන්න ස්ථාන බවට පත් වීම.
- පූතික ටැංකි සහ අවශෝෂණ ටැංකිවල එකතු වන අපජලය වරින් වර බැහැර කිරීම සඳහා කරදරකාරී සහ අධික වියදමක් දරමින් මලාපවහන රථවල (ගලි බවුසර්) සේවය ලබා ගැනීම මෙම ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව තව දුරටත් අවශ්‍ය නොවීම.

